# වාරිමාර්ග අමාත්‍යාංශය

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

## අරමුදල් සැපයීම ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසිනි

# උපදේශක සේවා

MWSIP වැඩසටහනේ වැඩසටහන් කළමනාකරණ ඒකකයේ (PMU) පහත සඳහන් පැවරුම සඳහා කොන්ත්‍රාත් පදනමින් අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින්/ අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**වැඩසටහන් කළමනාකරණ ඒකකය - (PMU) - කොළඹ**

**ස්වාධීන පරිසර ආරක්ෂක අධීක්ෂණ විශේෂඥ - 01 අයෙක් (පුද්ගල උපදේශක)**

**(කොන්ත්‍රාත් අංකය : MI/MWSIP/ADB/3268-SRI/Ind. Consultant/cs-03/Env.Mon/NCB/2021/048)**

**A) කාර්ය විෂය පථය**

අදාළ ස්වාධීන අධීක්ෂක විසින්, ආසියානු සංවර්ධන බැංකුවේ සහ ශ්‍රී ලංකා රජයේ පරිසර ආරක්ෂණ අවශ්‍යතාවල වන අනුකූලත්වය සහතික කරනු පිණිස, MWSIP වැඩසටහන යටතේ ක්‍රියාත්මක ඉදිකිරීම් ව්‍යාපෘති තුනක් වාරික වශයෙන් (සෑම මාස හයකට වරක්) සමාලෝචනය කිරීම භාරගත යුතුය. අදාළ උපදේශක විසින් PMU හා ADB ආයතන වෙත, සය මාසික අධීක්ෂණ වාර්තා සකස් කොට ඉදිරිපත් කළ යුතුය.

යෙදවුම්, සාමාන්‍ය වශයෙන් සෑම මාස තුනකට වරක් සෑම වසරකම දේශීය කාර්යාලය හා ක්ෂේත්‍රය පාදක කොට විය යුතු අතර, 2022 01 වන කාර්තුව සිට ආරම්භව 2024 4 වන කාර්තුව දක්වා වසර 3 ක කාලයක් සඳහා විය යුතුය.

**B) රැකියා විස්තරය**

- සියලුම උප ව්‍යාපෘති වැඩ බිම් තුනෙහි පාරිසරික කළමනාකරණ සැලසුම් හා නියාමන ප්‍රමිතීන් සම්බන්ධව කොන්ත්‍රාත්කරුගේ අනුකූලතාවය සහතික කරනු පිණිස වාරික වැඩ බිම් චාරිකා පැවැත්විය යුතුය.
- PMU හා PIU හි ක්‍රියාත්මක පරිසර කළමනාකරණ පද්ධති සමාලෝචනය කළ යුතු අතර, අදාළ වාර්තා පවත්වා ගැනීම හා ප්‍රතිඵලදායී අධීක්ෂණය පවත්වා ගැනීම සිදු කළ යුතුය.
- වැඩ බිමෙහි පවත්නා වාර්තා අධීක්ෂණය කොට සත්‍යෝක්ෂණය සහතික කරනු පිණිස අවශ්‍ය තියැදි පරීක්ෂා කළ යුතුය.
- ජාතික ආරක්ෂක නියාමනයන් හට අනුකූලතාවය සත්‍යෝක්ෂණය කරනු පිණිස ප්‍රධාන රජයේ නියෝජිතායතන (CEA, DWC ආදිය) සමග සාකච්ඡා කළ යුතුය.
- අනුකූලතා නොදක්වීම් සම්බන්ධව PMU ඒකකය වෙත උපදෙස් ලබාදිය යුතු අතර, පාරිසරික කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කළ යුතුය.
- දුක්ගැනවිලි සහන යාන්ත්‍රණය (GRM) අවශ්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සමත්ව ඇතිදැයි තක්සේරු කළ යුතු අතර, පාරිසරික ගැටලු සම්බන්ධ මහජන පැමිණිලි සම්බන්ධව ඵලදායී ලෙස කටයුතු කළ යුතුය.
- EIA (NWPCP හා NCPCP සඳහා) / IEE (MLBCRP සඳහා) හෝ EMP හි හඳුනාගත් යම් පාරිසරික බලපෑම් සම්බන්ධව කළ යුතු පිළියම් නිර්දේශ කළ යුතුය.
- CEA හි අනුමැති කොන්දේසි වලට EA හා කොන්ත්‍රාත්කරුවන්ගේ අනුකූලතාවය සහතික කළ යුතුය.

**C) සුදුසුකම් හා පළපුරුද්ද**

පාරිසරික විද්‍යා / කළමනාකරණය ක්ෂේත්‍රයේ මාස්ටර්ස් උපාධියක් හෝ සමාන උපාධියක්,

සහ

විශේෂයෙන් බහුපාර්ශව සංවර්ධන බැංකු අරමුදල් සැපයූ ඉදිකිරීම් ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් සකස් කිරීමේ හා පාරිසරික කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වසර 15 කට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා, කරුණාකර "www.mwsip.lk->information->Vacancies" වෙත යොමුවන්න.

**D) ගෙවීම් :**

සියලු ගෙවීම්, ශ්‍රී ලංකාවේ දේශීය (ජාතික) උපදේශකයන් විසින් පිළිගත් සමාන කාර්යයන් සඳහා පවත්නා වෙළඳ පොළ මිල ගණන් ප්‍රකාරව සිදුකරනු ලබන අතර, පහත සඳහන් අයවැය මාර්ග මත සාකච්ඡා කළ හැක:

1) මාසික වේතනය
2) ක්ෂේත්‍ර කාර්ය
3) වාර්තා සකස් කිරීම

**E) අයදුම්පත් භාරදීම හා අදාළ අවසන් දිනය :**

සම්පූර්ණ ජීව දත්ත, අධ්‍යාපනය, පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම්වලට සහය වීමට අදාළ සහතිකවල පිටපත් හා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් ඇතුළත් අයදුම්පත්, පහත සඳහන් ලිපිනය වෙත, 2022.01.28 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය:

**වැඩසටහන් අධ්‍යක්ෂ**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (mwsip),**
**වැඩසටහන් කළමනාකරණ ඒකකය (PMU), අංක 493 1/1 , ටී.බී. ජයා මාවත,**
**කොළඹ 10.**

අයදුම් කරනු ලබන පැවරුමේ නාමය, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල / සංස්ථාවල හා අනෙකුත් රජයේ ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් එක් එක් ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ. අදාළ ආයතන ප්‍රධානී විසින් මෙම අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත් පූර්ණ කාලීන පදනමින් දැනට හොබවන තනතුරින් නිදහස් කළ හැකිද යන්න සඳහන් කළ යුතුය.

**අනුර දිසානායක, ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය,**
**අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**